**ඇසෝසියේටඩ් නිව්ස්පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් - 2017**

**------------------------------------------------------------------------**

ඇසෝසියේටඩ් නිව්ස්පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් (සමාගම) හා එහි පරිපාලිතයන්හි 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශන, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 1973 අංක 28 දරන ඇසෝසියේටඩ් නිව්ස්පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් (විශේෂ විධිවිධාන) පනතේ 16 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සමාගමේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**--------------------------------------------------------------**

මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්ව (කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්ව සඳහා ශ්‍රී ලං මූ වා ප්‍ර) සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000–1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2. ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ඇසෝසියේටඩ් නිව්ස්පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි (සමාගම) සහ එහි පරිපාලිතයන් හි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ඒවායේ මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා සමාගමේ සම්පූර්ණ අයිතිය සතු පරිපාලිතයන් වන සීමාසහිත ලේක්හවුස් ප්‍රොපටි ඩිවලොප්මන්ට් පුද්ගලික සමාගම, සීමාසහිත ඔබ්සවර් ජොබ්ස් (පුද්ගලික) සමාගම සහ සීමාසහිත ලේක්හවුස් කනෙක්ට් (පුද්ගලික) සමාගමේ විගණිත මූල්‍ය ප්‍රකාශන ලබාගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා මෙම පරිපාලිතයන් විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන මත ඔබ්සවර් ජොබ්ස් (පුද්ගලික) සමාගමට තත්ත්වාගණනය නොකරන ලද මතයක් සහ පහත සඳහන් කරුණු මත පදනම්ව අනෙක් පරිපාලිතයන් දෙක සඳහා තත්ත්වාගණනය කරන ලද මතයන් මා විසින් ප්‍රකාශ කරන ලදී.

(අ) **ලේක්හවුස් කනෙක්ට් (පුද්ගලික) සමාගම**

(i) මුදල් ප්‍රවාහයක් සම්බන්ධ වී නොතිබුණ ද, මව් සමාගමට නිකුත් කරන ලද රු.71,800 ක් වටිනා පරිගණක ආයෝජන ක්‍රියාවලියෙන් ලද මුදල් ප්‍රවාහයක් ලෙස සමාලෝචිත වර්ෂය තුළ දී හඳුනාගෙන තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුළ විකුණුම් ආදායම් නොමැති වුවද, එකතුව රු.22,360 ක් වූ කුලී ගාස්තු සහ සුළු මුදල් වියදම් මූල්‍ය ප්‍රකාශනවල විකුණුම් පිරිවැය ලෙස හඳුනාගෙන තිබුණි.

(iii) 2017 දෙසැම්බර් 31 දිනට වූ රු.15,229,562 ක් වටිනා ණයගැතියන්ට අදාළව, කිසිඳු අයකර ගැනීමේ ක්‍රියා මාර්ගයක් නොමැතිව අඩමාන ණය සඳහා සම්පූර්ණ වෙන්කිරීම් සිදුකර තිබුණි.

(ආ) **ලේක්හවුස් ප්‍රොපටි ඩිවලොප්මන්ට් (පුද්ගලික) සමාගම**

(i) ආදායම් බදු වියදම් සහ පොළී ආදායම් වලට අදාළ ගනුදෙනු වූ මව් සමාගම සමග පවත්වාගෙන යන ජංගම ගිණුමේ වාර්තා කරන ලද පිළිවෙලින් රු.117,600 ක සහ රු.296,877 ක වටිනාකම සමග මුදල් ප්‍රවාහයන් සම්බන්ධ වී නොතිබුණ ද, සමාලෝචිත වර්ෂයේදී මෙහෙයුම් මුදල් ප්‍රවාහ සහ ආයෝජන මුදල් ප්‍රවාහ ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ හඳුනාගෙන තිබුණි.

(ii) තනි තනි ගිණුම්පවත්වාගෙන යාම වෙනුවට, සමාගම එකතුව පිළිවෙලින් රු.3,796,876ක් සහ  රු.117,600 ක් වූ ගනුදෙනු මව් සමාගම සමග පවත්වා ගෙන යන ජංගම ගිණුමේ හර සහ බැර ලෙස වාර්තාගත කර තිබුණි.

**2.2.2. සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.2.1 කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්ව සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල වීම (කු ම ප අ සඳහා ශ්‍රී ලං මු වා ප්‍ර)**

පහත නිරීක්ෂණයන් සිදුකරනු ලැබේ.

(අ) ප්‍රමිතියේ 13.4 වගන්තිය ප්‍රකාර පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු අගයට ගණනය කිරීමකින් තොරව රු.215,223,000 ක් වූ අවසාන තොගය පිරිවැයට අගය කර තිබුණි.

(ආ) රු.1,167,000,000 ක් පිරිවැය වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපල පිරියත සහ උපකරණ ඒවායේ ප්‍රයෝජනවත් ආර්ථිකමය ජීවකාලය සමාලෝචනය කිරීමෙන් තොරව සමාගම විසින් අඛණ්ඩව භාවිත කර තිබුණු අතර එපරිදි ගිණුම්ගත කර තිබුණි.

(ඇ) වගකීම් නිශ්චිත ලෙස නිරවුල් කළ හැකි සාධාරණ තක්සේරුවක් ගණනය කිරීමකින් තොරව සමාගමට විරුද්ධව පවරා තිබුණු නඩු සඳහා ඉල්ලීම් කළ වටිනාකමින් සියයට එකක ප්‍රමාණයකින් වෙන්කිරීම් සිදු කර තිබුණි.

(ඇ) සමාගමට විරුද්ධව පවරා ඇති නඩු 37 කට අදාළව වගකීම්වල ස්වභාවය සහ බලාපොරොත්තු වන වටිනාකම සහ කිසියම් ගෙවීමක් කළයුතු කාලය, එම ගලා යාම්වල ප්‍රමාණය සහ කාලය  පිළිබඳ අවිනිශ්චිතතාවයන්ගේ හැඟවීම් පිළිබඳව  සැකෙවින් විස්තර හෙළිදරව් කර නොතිබුණි.

(ඉ) ප්‍රමිතියේ දක්වා ඇති පරිදි 2017 දෙසැම්බර් 31 දිනට වූ නිශ්චිත ප්‍රතිලාභ සැලසුම යටතේ වූ රු.285,998,000 ක වගකීම් වටිනාකම එහි වර්තමාන අගයට මිණුම් කර දක්වා නොතිබුණි.

**2.2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත නිරීක්ෂණ සිදුකෙරේ.

(අ) සමාගමේ විශ්‍රාම ප්‍රතිලාභ වගකීමට අදාළ පාරිතෝෂික භාර අරමුදලේ රඳවා ඇති පිළිවෙලින් රු.283,258,000 ක් සහ රු.272,130,000 ක් වූ සැලසුම් වත්කම් සහ සැලසුම් වගකීම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික භාර අරමුදලේ ධාරන අගය වූ රු.272,130,000 ක් සහ එම ආයෝජනයෙන් ලැබිය යුතු පොළී ආදායම වූ රු.25,711,000 ක් විලම්බිත බදු

ආගණනයේ දී සැලකිල්ලට ගෙන නොතිබුණි. ඒ හේතුවෙන් විලම්බිත බදු වත්කම් ගිණුම රු.68,997,760 න් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ විවිධ පාර්ශවයන්ට නොමිලේ නිකුත් කර තිබුණු රු.80,000,000 ක් පිරිවැය වූ පුවත්පත් පරිත්‍යාග ලෙස වාර්තා කිරීම වෙනුවට විකුණුම් පිරිවැය ලෙස දක්වා තිබුණි.

(ඈ) සමාගම 2017 නොවැම්බර් 30 දින සිට 2017 දෙසැම්බර් 28 දින දක්වා කාලපරිච්ඡේදය තුළ රු.49,967,452 ක චෙක්පත් ලැබී තැන්පත් කළ ද, එම වටිනාකම මුදල් පොතේ සටහන් කර නොතිබුණි. බැංකු සැසඳුම් සකස් කිරීමට පෙර මුදල් ශේෂය නිවැරදි නොකිරීම නිසා, 2017 දෙසැම්බර් 31 දිනට වූ බැංකු අයිරා වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

**2.2.2.3 නොසැසඳු පාලන ගිණුම්**

-------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උපලේඛණ, රෙජිස්ටර් සහ ලෙජර ආදී දෑ සහ ඊට අනුරූපීව සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල ණයගැතියන්, ආදායම්, පාරිතෝෂික භාර අරමුදල් වගකීම් සහ ලැබිය යුතු පාරිභෝගික දායකයන් අතර එකතුව රු.28,532,877 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

(ආ) අගරු චෙක්පත් රෙජිස්ටරයේ දැක්වෙන එකතුව රු.1,725,631 ක් වූ අගරු චෙක්පත් 36 ක් අගරු චෙක්පත් උපලේඛණයේ ඇතුළත් කර නොතිබුණි.

**2.2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-------------------------------------

පහත නිරීක්ෂණයන් සිදුකරනු ලැබේ.

(අ) වසරක සිට වසර පහට වැඩි කාල පරිච්ඡේදයක් දක්වා වූ සමාගමේ බැංකු ගිණුමකට ලද රු.329,635 ක් වූමුදල් ඇණවුම් 94 ක් උපලබ්ධි නොවී හිඟව පැවතුණි.

(ආ) ණයගැතියන්ගෙන් ලද ශේෂ සනාථ කිරීම් අනුව, වටිනාකම රු.6,073,154 ක් වූ ණයගැතියන් ඔවුන්ගේ ශේෂ සමග එකඟ වී නොතිබුණි. 2018 මැයි 24 දින වන විටත් වටිනාකම රු.610,529,468 ක් වූ ණයගැතියන්ගෙන් තවදුරටත් ශේෂ සනාථ කිරීම් ලැබී නොතිබුණි. ඒ අතර, එකතුව රු.103,707,303ක් වූ වෙළඳ ණයගැතියන් වසරකට වඩා හිඟ හිටව පැවති අතර එම වටිනාකමින් රු.31,932,961 ක් හෙවත් සියයට 31 ක් අයකර ගැනීමට නොහැකි සේ සලකා නීතිමය අංශයට යොමුකර තිබුණි. එම නිසා, මූල්‍ය ප්‍රකාශනවල දක්වන ලද රු.626,551,673 ක මුළු ණයගැති ශේෂයේ නිවැරදිතාවය සහ විශ්වාසනීයත්වය පිළිබඳව විගණනයේදී සහතික කළ නොහැකි විය.

(ඇ) සමාගම සමග ඔවුන්ගේ දායකයන් පවත්වාගෙන නොගිය ගනුදෙනුකරුවන් වෙත සමාගම විසින් 2017 දෙසැම්බර් 31 දිනට රු.9,962,657 ක් වටිනා පුවත්පත් නිකුත්කර තිබුණි. එම ප්‍රමාණයෙන් රු.5,289,168ක් 2011 සිට 2016 දක්වා හිඟව පැවතුණු අතර මෙම වටිනාකම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2006 අංක 10දරන දේශීය ආදායම් පනතේ 114(1) වගන්තිය හා 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.7 වගන්තිය | 2017 අප්‍රේල් සිට 2018 මාර්තු දක්වා කාලපරිච්ඡේදය තුළ සේවකයන්ට ගෙවන ලද වරප්‍රසාද දීමනා සඳහා උපයන විට ගෙවීම්බදු ලෙස රු.4,845,445 ක මුදලක් අදාළ සේවකයින්ගෙන්අඩුකර ගැනීමෙන් තොරව සමාගම විසින් ගෙවා තිබුණි. |
| (ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1වගන්තිය | සමාගම එහි බඳවා ගැනීම් හා උසස්වීම් යෝජනා ක්‍රමය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහ රාජ්‍ය ව්‍යාපාරදෙපාර්තමේන්තුවේ එකඟත්වය ලබාගෙන නොතිබුණි. |
| (ඇ) 2015 ජූනි 17 දිනැති අංක පීඊඩි 3/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සමාගම රජයට අයත් ව්‍යවසායයක් බවට වර්ගීකරණය කර තිබුණද, මුදල් අමාත්‍යාංශයෙන් හෝ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද කිසිඳු නිර්දේශයක් මේ දක්වා අනුගමනය කර නොතිබුණි. 2017 ජූනි 29 දිනැති අධ්‍යක්ෂ මුදල්ගේ ලිපියෙන් මේ සම්බන්ධයෙන් කළමනාකරණය “පීඊඩී චක්‍රලේඛයන්ගෙන් බැහැරවීම සඳහා මුදල් අමාත්‍යවරයා සමග සාකච්ඡාවක් පැවැත්වූ බව” මා වෙත දන්වා තිබුණි. කෙසේවුවද, එවැනි අනුමැතියක් මේ දක්වා ද ලැබී නොතිබුණි. |
| (ඈ) 2017 දෙසැම්බර් 11 දිනැති අංක පීඊඩි3/2017 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛයේ ප්‍රතිපාදන අනුව 2017 වර්ෂය සඳහා සමාගම විසින් සේවකයෙකුට රු.13,500 ක් පමණක් ප්‍රසාද දීමනා ලෙස ගෙවිය හැකිය. කෙසේවුවද, සමාලෝචිත වර්ෂයේදී මූලික වැටුපෙන් මාස 4½ ක් යන පදනම මත සමාගම එහි සේවකයන්ට ප්‍රසාද දීමනා ලෙස ගෙවීම් රු.164,496,986 ක් විය. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද සමාගමේ මූල්‍ය ප්‍රකාශන සහ සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ සහ සමූහයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය පිළිවෙලින් රු.243,660,000 ක් සහ රු.270,397,000 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ ලාභය පිළිවෙලින් රු.40,631,000 ක් සහ රු.29,008,000 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල පිළිවෙලින් රු.203,029,000 ක සහ රු.241,389,000 ක වර්ධනයක් දැක්වුණි. 2016 වර්ෂයේදී ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ යෝජනාවලියක් හඳුන්වා දී තිබුණු අතර එම යෝජනාවලිය යටතේ සමාගම විසින් සේවකයන්ට රු.163,513,000 ක් ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එවැනි වියදමක් පැන නැගී නොතිබුණි. එය සමාලෝචිත වර්ෂය තුළ මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට බලපෑ ප්‍රධාන හේතුව විය.

පසුගිය වර්ෂ හතර සහ සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රතිඵල සැලකිල්ලට ගැනීමේ දී, 2013 සිට 2017 දක්වා අගය එකතුවීම උච්චාවචනය වී තිබුණි. කෙසේවුවද, වැටුප්, බදු හා ක්ෂය (ලාභාංශ සහ සාධාරණ අගය ගැළපීමට පෙර) සැලකිල්ලට ගැනීමෙන් පසු 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ දී සියයට 6 ක අඩුවීමක් පෙන්නුම් කරමින් 2016 සහ 2017 වර්ෂ සඳහා අගය එකතුවීම පිළිවෙලින් රු.2,153,741 ක් සහ රු.2,025,767 ක් විය.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-----------------------------------

### 3.2.1 වැදගත් ගිණුම්කරණ අනුපාත

-------------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන්ට අනුව සමාගමේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| | 2017<br>ප්‍රතිශතය | 2016<br>ප්‍රතිශතය |
|---|---|---|
| දළ ලාභ ආන්තිකය | 55.32 | 53.69 |
| ලකුණු කළ ලාභය (විකුණුම් පිරිවැය මත දළ ලාභය) | 123.81 | 115.92 |
| පිරිවැටුම මත පරිපාලන පිරිවැය | 38.10 | 43.85 |
| පිරිවැටුම මත විකුණුම් හා බෙදාහැරීම් පිරිවැය | 10.83 | 10.86 |
| පිරිවැටුම මත මූල්‍ය පිරිවැය | 2.29 | 1.64 |
| ජංගම අනුපාතය | 2.50 | 2.12 |
| ක්ෂණික අනුපාතය | 2.09 | 1.60 |

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ දළ ලාභ ආන්තිකය හා ලකුණු කළ ලාභය පිළිවෙලින් සියයට 1.63 කින් හා සියයට 7.89 කින් පමණක් වැඩි වී තිබුණි.

# 4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

## 4.1 කාර්ය සාධනය

----------------

### 4.1.1 සැලසුම්කරණය

-----------------

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) 2017 – 2019 කාලපරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමේ මූලික කටයුතු 2016 සැප්තැම්බර් ආරම්භ කර තිබුණ ද, ඒ සම්බන්ධයෙන් වූ ගිවිසුම්වලට එළඹීම 2017 පෙබරවාරි 23 දින සිදු වී තිබුණි. කෙසේවුවද, 2017 අවසාන භාගයේ දී ඉදිරිපත් කරන ලද සංයුක්ත සැලැස්ම 2018 – 2020 කාලපරිච්ඡේද ආවරණය වන පරිදි පිළියෙල කර තිබුණු අතර එය 2017 වර්ෂය ආවරණය කර නොතිබුණි. එම නිසා සමාලෝචිත වර්ෂය සඳහා සමාගම විසින් ව්‍යාපාර පරිසරයේ ශක්තීන් සහ දුර්වලතා මෙන්ම අවස්ථා සහ තර්ජන සම්බන්ධයෙන් මනා විශ්ලේෂණයක් සිදුකර නොතිබුණි.

(ආ) සමාගමේ සාමාන්‍යාධිකාරී විසින් 2017 ඔක්තෝබර් 27 දින එවන ලද ලිපිය පරිදි, 2016 වර්ෂයේ පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ දැක්වූ ක්‍රියාකාරී අංශ 2017 දී ක්‍රියාත්මක කිරීම සඳහා දීර්ඝ කළ බව විගණනය වෙත දන්වා තිබුණි. කෙසේවුවද, 2016 වර්ෂය සඳහා

පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ දක්වන ලද ඉලක්කයන් 2017 වර්ෂය සඳහා ගැළපෙන පරිදි විශ්ලේෂණය සහ යාවත්කාලීන කිරීමක් සිදුකර නොතිබුණු අතර එවැනි සැලැස්මක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියක් ලබාගෙන නොතිබුණි. එම නිසා යෝග්‍ය උපක්‍රම හඳුනාගෙන ව්‍යාපාර අරමුණු ඉටුකර ගැනීම සංයුක්ත සැලැස්මක් පිළියෙල කිරීම තුළින් කළමනාකරණය බලාපොරොත්තු වුවද සමාලෝචිත වර්ෂය තුළ එය ඉටු වී නොතිබුණි.

**4.1.2. කාර්ය සාධනය සහ සමාලෝචනය**

---------------------------------------

1973 අගෝස්තු 04 දිනැති අංක 71/1 දරන ශ්‍රී ලංකා ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 1973 අංක 28 දරන ඇසෝසියේටඩ් නිව්ස් පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් (විශේෂ විධිවිධාන) පනතේ වගන්ති 2 සහ 17 පරිදි, සමාගමේ ප්‍රධාන අරමුණු (i)යම් ප්‍රවෘත්ති පත්‍රයක් හෝ වෙනත් ප්‍රකාශන ආරම්භ කිරීම, අත්කර ගැනීම, මුද්‍රණය කිරීම, පළ කිරීම හා බෙදාහැරීම සහ මුද්‍රණකරුවන්, ලිපිද්‍රව්‍ය වෙළඳුන්, යන්ත්‍ර රූල්කරුවන්, අංක මුද්‍රණකරුවන්, ලිතෝ මුද්‍රණකරුවන්, අකුරු වාත්තුකරුවන් ආදී දෑ පිළිබඳ සියලුම ව්‍යාපාර හෝ ඒවායින් යම් ව්‍යාපාරයක් කරගෙන යාම (ii)කැටයම් කැපීම, මුද්‍රණ, පින්තූර, චිත්‍ර සහ ප්‍රචාරක නියෝජිතයන්ගේ, ප්‍රචාරක කොන්ත්‍රාත්කරුවන්ගේ සහ ප්‍රචාරක සැලසුම්කරුවන්ගේ, නිෂ්පාදකයින්ගේ, නියෝජිතයන්ගේ, බෙදාහරින්නන්ගේ හා වෙළඳුන්ගේ ව්‍යාපාර කටයුතු කරගෙන යාම (iii) චිත්‍රපට සහ පින්තූර, විනෝදාංශ, සංගීතය සහ ශබ්ද යාන්ත්‍රිකව නැවත නිපදවීම හෝ සම්ප්‍රේෂණය කිරීම හා සම්බන්ධ වෙනත් උපකරණ හා යන්ත්‍ර නිෂ්පාදකයින් පිළිබඳ ව්‍යාපාර කටයුතු කරගෙන යාම (iv)සංචාරක නියෝජිතයන් ලෙස ව්‍යාපාර කරගෙන යාම වේ. සමාලෝචිත වර්ෂය තුළ ඉහත සඳහන් අරමුණු ක්‍රියාත්මක කිරීම පිළිබඳ පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂය තුළ දී ප්‍රසිද්ධ කරන ලද වර්ග 06 ක පුවත්පත් සහ වර්ග 09 ක වාර සඟරාවලට සාපේක්ෂව සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුළ වර්ග 06 ක පුවත්පත් සහ වර්ග 12 ක වාර සඟරා ප්‍රසිද්ධ කර තිබුණි. ඉකුත් වර්ෂයේ දී දිනමිණ සහ සිළුමිණ සමග අතිරේක වශයෙන් නිකුත් කරන ලද වාර සගරා තුන සමාලෝචිත වර්ෂය තුළ දී ද තවදුරටත් ඉදිරියට ගෙන යමින් තිබුණි. කෙසේවුවද, 2015 වර්ෂයට සාපේක්ෂව 2016 දී පුවත්පත් 06 න් ලද සමස්ත විකුණුම් ආදායම රු.47,582,000 න් අඩු වී තිබුණු අතර 2016 ට සාපේක්ෂව 2017 වර්ෂයේ දී පුවත්පත් 05 න් ලද විකුණුම් ආදායමේ සමස්ත අඩුවීම රු.22,596,000ක ප්‍රමාණයක් විය.

(ආ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව 2017 දී “තරුණී”, “සරසවිය” සහ “බුදුසරණ” නම් වූ වාර සඟරා තුනෙන් වූ විකුණුම් ආදායම පිළිවෙලින් රු.7,489,000 ක්, රු.276,000 ක් සහ රු.309,000 ක් ලෙස අඩු වී තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ පුවත්පත් 04 ක් සහ වාර සඟරා 06 ට අදාළව අලෙවිකරන ලද පිටපත් සංඛ්‍යාව 1,117,279 ක් හෙවත් සියයට 6.41 න් අඩු වී තිබුණු අතර 2017 දී පුවත්පත් 05 ක සහ වාර සඟරා 06 ක මුද්‍රණය ද 1,336,959 ක් හෙවත් සියයට 6.18 න් අඩු වී තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව 2017 දී වාණිජ මුද්‍රණ අංශය, විශේෂ ප්‍රකාශන සහ ඩිජිටල් මුද්‍රණයන්ගේ ආදායම පිළිවෙලින් රු.6,454,000 ක්, රු.1,354,000 ක් සහ රු.1,583,000 ක් වශයෙන් අඩු වී තිබුණි.

(ඉ) වැඩි දැන්වීම් ප්‍රමාණයක් ආකර්ෂණය කර ගැනීම සඳහා සමාගම දැන්වීම් / අලෙවි කළමනාකරුවන්ට දිරිදීමනා යෝජනා ක්‍රමයක් හඳුන්වා දී තිබුණ ද, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමස්ත දැන්වීම් ආදායම රු.මිලියන 45.56 න් අඩු වී තිබුණි.

**4.2 සමාගමට එරෙහිව ආරම්භකර ඇති නඩු**

1981 ඔක්තෝබර් 14 දිනැති අංක 162/5 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් නිවේදනයෙන් "මාධ්‍යවේදීන් සඳහා ආචාර ධර්ම සංග්‍රහය" ප්‍රසිද්ධ කර තිබුණද,බාහිර පාර්ශවයන් විසින් සමාගමට එරෙහිව අපහාස නඩු 05 ක් ගොනු කර තිබුණු අතර උසාවි විසින් පැමිණිලිකරුවන්ට රු.මිලියන 519 ක් ගෙවන ලෙස නියම කර තිබුණි. පසුව සමාගම එම තීන්දුවලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කර තිබුණි. තවද, 2017 දෙසැම්බර් 31 දින වන විට නීතිමය තීන්දු ලැබෙන තෙක් තවත් අපහාස නඩු 07 ක් තිබුණි.

**4.3 කළමනාකරණ කටයුතු**

පහත නිරීක්ෂණ සිදු කෙරේ.

(අ) 2013 වර්ෂය තුළදී එහි මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලද සමාගමේ පරිපාලිතයන්ගෙන් එකක් වන ලේක්හවුස් කනෙක්ට් (පුද්ගලික) සමාගම (පෙර බිස්නස් ලංකා ඒඑන් (පුද්ගලික) සමාගම ලෙස හඳුන්වන ලද), 2017 දෙසැම්බර් 31 දින වන විට එකතු අලාභය රු.25,868,875 ක් ලබා තිබුණි. තවද, විධිමත් අයකර ගැනීමේ ප්‍රතිපත්තියක් නොමැති වීම නිසා, 2017 දෙසැම්බර් 31 දින වන විට අඩමාන ණය රු.15,229,562 ක් දක්වා කැපී පෙනෙන ලෙස වර්ධනය වී තිබුණි. ඒ අතර, පරිපාලිතයේ වියදම් මූල්‍යයනය කිරීම හේතුවෙන්, සමාගමට මෙම පරිපාලිතයෙන් 2017 දෙසැම්බර් 31 දින වන විට ලැබිය යුතු ප්‍රමාණය රු.22,704,067 ක් විය. කෙසේවුවද, මෙම ලැබිය යුතු ප්‍රමාණයට එරෙහිව එදිනට සමාගම පූර්ණ වෙන්කිරීම් සිදුකර තිබුණි. තවද, අඛණ්ඩ ව්‍යාපාර අලාභ, සෘණ කාරක ප්‍රාග්ධනය සහ සෘණ නුබුන්වත් ආන්තිකය හේතුවෙන් පරිපාලිතයේ අධ්‍යක්ෂ මණ්ඩලය 2018 පෙබරවාරි 15 දින එහි මෙහෙයුම් නවතා දැමීමට තීරණය කර තිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට සමාගමේ පරිපාලිතයක් වන ඔබ්සවර් ජොබ්ස් (පුද්ගලික) සමාගම (පෙර ඉන්ෆෝ මීඩියා (පුද්ගලික) සමාගම ලෙස හඳුන්වන ලද) එකතු අලාභය රු.13,122,685 ක් ලබා තිබුණි. මෙම පරිපාලිතය ද එහි මෙහෙයුම් වියදම් මූල්‍යයනය කිරීම සඳහා සම්පූර්ණයෙන්ම සමාගම මත රැඳී සිටීම නිසා 2017 දෙසැම්බර් 31 දිනට සමාගමට ලැබිය යුතු වටිනාකම රු.10,695,637 ක් විය. කෙසේවුව ද, එම ලැබිය යුතු ප්‍රමාණයට එරෙහිව එදිනට සම්පූර්ණ වෙන්කිරීම් සිදුකර තිබුණි. අඛණ්ඩ ව්‍යාපාර අලාභ, සෘණ කාරක ප්‍රාග්ධනය සහ සෘණ නුබුන්වත් ආන්තිකය හේතුවෙන් පරිපාලිතයේ අධ්‍යක්ෂ මණ්ඩලය 2018 පෙබරවාරි 15 දින එහි මෙහෙයුම් නවතා දැමීමට තීරණය කර තිබුණි.

(ඇ) 1985 දී දේපල සංවර්ධන ව්‍යාපාරයේ නියැලීම සඳහා පිහිටුවන ලද ලේක්හවුස් ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් (පුද්ගලික) සමාගම මේ දක්වාම මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් කිසිදු මුදල් ප්‍රවාහයක් උපයා නොතිබුණි.

(ඈ) 2017 දෙසැම්බර් 31 දින වන විට රු.12,336,645 ක් වටිනාකමැති අගරු චෙක්පත් 161 ක් විය. ඉන් රු.1,693,116 ක් වටිනාකමැති චෙක්පත් 55 ක් සහ රු.708,289 ක් වටිනා චෙක්පත් 28 ක් පිළිවෙලින් වර්ෂ 5 ට වඩා සහ වර්ෂ 3 ට වඩා හිඟ හිටව පැවති අතර වගකිවයුතු පාර්ශවයන් ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග නොගෙන පැවතුණි.

(ඉ) සමාගම ලංකා පුවත්පත් සමාගමේ - ශ්‍රී ලංකාවේ ජාතික පුවත් නියෝජිතායතනය කොටස් 1200 ක් මිල දී ගැනීමට 2008 දෙසැම්බර් අතුරු ගෙවීමක් ලෙස රු. මිලියන 1.2 ක් ගෙවා තිබුණ ද, 2017 දෙසැම්බර් 31 දින තෙක් කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි. තවද, ලංකා පුවත් සමාගමට අදාළ සේවකයන් තුන්දෙනෙකුට සමාලෝචිත වර්ෂය තුළ වැටුප් සහ වේතන වශයෙන් රු.2,151,146 ක් ගෙවා තිබුණි.

(ඊ) ණයගැතියන් සමග ගනුදෙනු කළ අදාළ උපකාරක ලියවිලි අස්ථානගත වීම හේතුවෙන්, දින 720 ට වඩා හිග හිටි රු.4,552,559 ක් වටිනා ණයගැතියන් හතර දෙනෙකුට එරෙහිව සමාගමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමට නොහැකි වී තිබුණි.

(උ) 2008 පෙබරවාරි 06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 05/2008 න් ඉල්ලා සිටින ලද පරිදි සමාගම පුරවැසි ප්‍රඥප්තිය හඳුන්වා දී නොතිබුණි.

**4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

--------------------------------

පහත නිරීක්ෂණ සිදුකරනු ලැබේ.

(අ) සමාගම දැන්වීම් නියෝජිතයන්ට ඔවුන් ගිවිසුම්වලට එළඹෙන විට සමාගමේ තැන්පත් කරන ලද තැන්පත් සඳහා වාර්ෂිකව සියයට 10 ක පොලියක් ගෙවා තිබුණි. තැන්පතු සීමාව, එවැනි පොලියක් ගෙවීමට තීරණය කිරීම සහ පොලී අනුපාතය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂය තුල පුවත් නියෝජිතයන් 460 ට පොලී ලෙස රු.3,137,318 ක ප්‍රමාණයක් ගෙවා තිබුණ ද, මේ සම්බන්ධයෙන් ආයෝජන සැලැස්මක් හඳුන්වා දී නොතිබුණි. පසුව මෙම පුවත් නියෝජිතයන් වෙත ඔවුන් සමාගමට ඇති ණය පියවීමේ දී දින 50 ක ණය කාල සීමාවක් ලබා දී තිබුණි.

(ආ) සමාගම කොළඹ සිට කතරගමට සහ කොළඹ සිට යාපනයට පිළිවෙලින් 2015 සහ 2016 සිට බස් සේවා දෙකක් නඩත්තු කර තිබුණි. කුලී පදනම මත ගමනකට පිළිවෙලින් රු.31,000 ක් සහ රු.60,000 ක් බැගින් බස් සැපයීම සඳහා පෞද්ගලික ආයතන දෙකක් තෝරාගෙන තිබුණි. ඉහත ආයතනවලට පිළිවෙලින් එකතුව රු.11,140,023 ක් සහ රු.22,500,000 ක් ගෙවා තිබුණ ද මෙම අරමුණ සඳහා ඔවුන් සමග ගිවිසුමකට එළඹ නොතිබුණි. ඒ අතර, සමාලෝචිත වර්ෂය තුළ සමාගම මෙම බස් සේවාවලින් පිළිවෙලින් රු.4,928,589 ක සහ රු.6,899,920 ක බරපතල අලාභ ලබා තිබුණි.

**4.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත වත්කම්**

--------------------------------------------

නිවාස යෝජනා ක්‍රමයක් ඉදිකිරීම සඳහා මිලදී ගෙන තිබුණු හෝකන්දර පිහිටි අක්කර 8 ක ඉඩම, 1985 සිට නිෂ්කාර්යව පැවතුණි.

**4.6 මානව සම්පත් වෙනත් ආයතනවලට මුදා හැරීම**

--------------------------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන චක්‍රලේඛයේ 9.4 වගන්තියේ විධිවිධානවලට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළ පුවත්පත් කලාවේදීන් හතර දෙනෙකු, සහකාර කර්තෘවරයෙකු, කළමනාකාර කර්තෘවරයෙකු, සහකාර සාමාන්‍යාධිකාරි - කාර්මික, ඡායාරූප ශිල්පියෙකු, පෘෆ් කියවන්නෙකු, සහකාර කළමනාකාරවරයෙකු හා සාමාන්‍ය සහකාරවරයෙකු ඇතුළත් නිලධාරීන් එකොලොස් දෙනෙකු වෙනත් රජයේ ආයතනවල සේවය සඳහා මුදාහැර තිබුණි. ඔවුන් වෙනුවෙන් වැටුප්, වේතන හා දීමනා ලෙස රු.9,751,458 ක මුදලක් සමාගම විසින් වැයකර තිබුණි. පුවත්පත් කලාවේදීන් හතර දෙනෙකු මුදාහැර තිබුණ ද, සමාලෝචිත වර්ෂය තුළ නව පුවත්පත් කලාවේදීන් දහතුන් දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි.

## 4.7 කාර්ය මණ්ඩල කළමනාකරණය

පහත නිරීක්ෂණයන් සිදුකරනු ලැබේ.

(අ) යහපත් කාර්ය මණ්ඩල කළමනාකරණය සඳහා කුසලතා අත්කර ගැනීම, උසස් කිරීම, නිවාඩු ප්‍රතිපත්ති ආදී වශයෙන් වූ ප්‍රතිපත්ති හතක් සමාගම විසින් සකස් කර තිබුණ ද, 2018 අගෝස්තු 31 දිනට කාර්ය සාධන කළමනාකරණ ප්‍රතිපත්තියට පමණක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ රු.3,117,500 ක් ගෙවමින් මානව සම්පත්, අභ්‍යන්තර විගණන, කර්තෘ මණ්ඩල සහ තොරතුරු තාක්ෂණය යන ක්ෂේත්‍රයන්හි උපදේශකවරුන් හතර දෙනෙකුගේ සේවය ලබාගෙන තිබුණ ද, කොන්ත්‍රාත් කාලච්ඡේදය අවසාන වන විට ඔවුන් විසින් ඉටුකරන ලද සේවයට අදාළව වාර්තා සමාගමට ඉදිරිපත් කර නොතිබුණි. මේ අතරතුර, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතින් රහිතව උපදේශකවරුන් දෙදෙනෙකුගේ සේවා ලබාගෙන තිබුණි.

(ඇ) සමාගමට සුදුසු කුසලතා සහිතව එහි සේවකයන්ගේ ඵලදායිකත්වය ඉහළ දැමීම සඳහා යථාරූපී සේවක ලැයිස්තුවක් තිබිය යුතු වුවද, යථාරූපී බව තක්සේරු කිරීමට සමාගමේ සේවක ලැයිස්තුව 2012 ජූලි 01 දිනෙන් පසුව කාලානුරූපීව සමාලෝචනය කර නොතිබුණි. කර්තෘ දෙපාර්තමේන්තුව සහ සාමාන්‍ය පරිපාලනය සඳහා සමාගම විසින් පිළියෙල කරන ලද අනුමත සේවක ලැයිස්තුව අනුව සේවකයින් 522 ක් අතිරික්ත වූ අතර ඉන් සේවකයින් 268 ක් කොන්ත්‍රාත් පදනමින් විය.

(ඇ) සමාගමේ බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පරිපාටියේ අවශ්‍යතා පරිදි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන් දෙදෙනෙකු, සහකාර කළමනාකරුවන් තුන් දෙනෙකු, කළමනාකරුවන් තුන් දෙනෙකු සහ ජ්‍යෙෂ්ඨ සහකාර ගණකාධිකාරිවරයෙකු අවම සුදුසුකම් හෝ සපුරා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂාවක දී හෙළිදරව් විය.

## 5. තිරසාර සංවර්ධනය

## 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතී. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදුකෙරේ.

(අ) සමාගම විසින් මෙම අරමුණු පිළිබඳ දැනුවත් වී නොතිබීම හේතුවෙන්, එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන් ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනා ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ආ) "තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා සූදානම් වීම" සමාගමේ විෂය පථයෙන් පරිබාහිර බව සමාගම දන්වා තිබුණ ද, ස්ත්‍රී පුරුෂ සමානතාවය, කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම, පූර්ණ සහ ඵලදායි සේවා නියුක්තිය සහ සියළු දෙනා සඳහා ඔබින කාර්යයන්, පහසු යටිතල පහසුකම් ගොඩ නැගීම, තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය සහ නවෝත්පාදනය ධෛර්යමත් කිරීම ආදී දෑ න්‍යාය පත්‍රය යටතේ වූ අරමුණු 17 න් සමාගමට අදාළ වන අරමුණු කිහිපයක් විය හැකිය.

## 6. ගිණුම් කටයුතු භාවය හා යහ පාලනය

## 6.1 විගණන කමිටු

විගණන කමිටුව අවම වශයෙන් විධායක නොවන සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත යුතු අතර භාණ්ඩාගාර නියෝජිතයකු හෝ මූල්‍ය කළමනාකරණ කුසලතා දරන පුද්ගලයෙකු විසින් සභාපතිත්වය දැරිය යුතු වුව ද, එම රැස්වීම් වලට භාණ්ඩාගාර නියෝජිතවරයෙකු සහභාගී වී නොතිබුණු අතර විධායක අධ්‍යක්ෂකවරයෙකු සභාපතිත්වය දරා තිබුණි.

## 6.2 අයවැය පාලනය

අයවැය ගත හා තථ්‍ය සංඛ්‍යා අතර සියයට 20 සිට සියයට 112 දක්වා පරාසයක සැලකිය යුතු බැහැරවීම් නිරීක්ෂණය වූයෙන් අයවැය ඵලදායි කළමනාකරණ කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 6.3 නොවිසඳුණු විගණන ඡේද

ඉකුත් වර්ෂයේ කරන ලද විගණන වාර්තාවෙන් අවධාරණය කරන ලද පහත සඳහන් කරුණු සඳහා නිසි සැලකිල්ලක් යොමුකර නොතිබුණි.

(i) ලේක්හවුස් ප්‍රොපටි ඩිවලොප්මන්ට් පුද්ගලික සමාගමේ හා ඔබ්සවර් ජොබ්ස් පුද්ගලික සමාගමේ ආයෝජනය කරන ලද පිළිවෙලින් රු.7,500,000 ක් හා රු.2,500,000 ක් වූ ආයෝජනයන් මත කිසිදු ප්‍රතිලාභයක් නොලැබීම.

(ii) ලෙජර ශේෂයන් හා අනුරූපී කාල විශ්ලේෂණ අතර වෙනස්කම් නිරූපනය වීම.

(iii) අගරු චෙක්පත් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග නොගැනීම

## 7. පද්ධති හා පාලන

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා සමාගමේ සභාපතිගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| ක්ෂේත්‍රය | | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) ණයගැති කළමනාකරණය | - | ලෙජර් ශේෂයන් හා කාල විශ්ලේෂණයන් අතර වෙනස්කම් පැවතීම සහ සනාථ නොකරන ලද ණයගැතියන්ගේ ශේෂ සමාලෝචනය නොකිරීම |
| (ආ) ආදායම් කළමනාකරණය | - | පුවත්පත් විකුණුම් ආදායම අඩුවීම,පුවත්පත් සහ වාර සඟරා මුද්‍රණය අඩුවීම |
| (ඇ) මානව සම්පත් කළමනාකරණය | - | අනුමත බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පටිපාටි නොවීම |
| (ඈ) පසු - සේවක ප්‍රතිලාභ | - | පාරිතෝෂික භාර අරමුදලේ රඳවා ඇති සැලසුම් වත්කම් සහ සැලසුම් වගකීම් හෙළිදරව් නොකිරීම |